බාලවයස් ලිංගික අපරාධයන් සහ ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් පළ වන පුවත් වාර්තාවන් නිරීක්ෂණය කිරීමේදී දක්නට ලැබෙනා එක් ප්‍රවණතාවයක් වන්නේ, එම ඇතැම් පුවත් වාර්තාවන්හි එම වරද වඩාත් සැහැල්ලු කොට දැක්වෙන ආකාරයේ සිරස්තල යෙදී තිබීමයි.

එයට උදාහරණයක් ලෙසින් බාලවයස් දැරියකගේ ජංගම දුරකථනයට අසැබි දසුන් යැවූ අයෙකු අත්අඩංගුවට ගැනුණු පුවතක්, දිවයින (08/19) පුවත්පතේ "දෙදරූ පියාගේ කාම වෙට්ටුව නීතියේ" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් වූ ආකාරය දැක්විය හැක. මෙම පුවතම වාර්තා කරනා මව්බිම එය ඉදිරිපත් කරන්නේ "දහතුන් හැවිරිදි පාසල් දැරියගේ ජංගම දුරකථනයට අසැබි දසුන් යැවූ 37 හැවිරිදි දෙදරූ පියා අත්අඩංගුවේ" යනුවෙනි.

මෙහිදී දිවයින පුවත් සිරස්තලයෙන් මෙම වරද පැහැදිලිව ඉදිරිපත් වී නොතිබෙන අතර, මව්බිම සිරස්තලයෙන් එය පැහැදිලිවම සන්නිවේදනය වන අයුරු අපට නිරීක්ෂණය කළ හැක. පුවතකට සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමට තිබෙන අවකාශය අපට ඉවතලිය හැකි නොවේ. නමුත්, මෙවැනි බාලවයස්කරුවෙකුට සිදුකළ ලිංගික හිරිහැරයක් සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී වඩාත් යෝග්‍ය සිරස්තලය දිවයින පුවත්පත යොදා ඇතැයි ඔබ සිතන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima**